**ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 21 දින දෙපාර්තමේන්තුවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම, සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 12.00 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 9.38 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2.62 ක් හෙවත් සියයට 21.8 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.දහස් | රු.දහස් | රු.දහස් | |
| පුනරාවර්තන | 11,000 | 8,888 | 2,112 | 19.2 |
| මූලධන | 1,000 | 493 | 507 | 50.7 |
| එකතුව | 12,000 | 9,381 | 2,619 | 21.8 |

**අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 23101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.දහස්** | **රු.දහස්** | **රු.දහස්** | **රු.දහස්** | **රු.දහස්** | **රු.දහස්** |
| 1,255 | 292 | 355 | 486 | 2,500 | 1,399 |

## 2.3 විගණන නිරීක්ෂණය

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** | **නිරීක්ෂණ** |
|---|---|---|---|
| (අ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (ආ) | රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) | පවත්වා නොතිබුණි |
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි |
| (ඈ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:11:2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ලංසුකැඳවීමේලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:2:1 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි |
| (ඊ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (උ) | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම්, ආදිය සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 | යාවත්කාලීන කර නොතිබුණි. |

**3.2 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.2.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**3.2.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුනි 20 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.3 අනුකූල නොවීම**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| 1941 අංක 39 දරන ණය සහනදායක ආඥා පනතේ 2(1) වගන්තිය | - | මණ්ඩලයට එක් සාමාජිකයෙකු අඩුවෙන් පත්කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| | 11 වන පරිච්ඡේදයේ 13.3 වගන්තිය | - | 2013 මැයි මාසයේ සිට වැඩ බැලීමේ පදනම මත ලේකම් පත් කර තිබුණි. |
| **(ඇ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | මුදල් රෙගුලාසි 237(ආ) | 472,470 | ද්‍රව්‍ය කාර්යාලයට ලැබුණු බවට සහතිකයක් නොමැතිව ගෙවීම් සහතික කර තිබීම |

**3.4 කාර්යසාධනය**

2015 වර්ෂය තුළ කටයුතු කිරිමට ඉල්ලුම්පත් 1,249 ක් පැවැතුණු අතර ඉන් ඉල්ලුම්පත් 372 ක ප්‍රමාණයක් නිම කර තිබුණි. ඒ අනුව වර්ෂය තුළ ඉටු කළ යුතුව තිබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාවෙන් සියයට 30 ක පමණ ප්‍රමාණයක ඉල්ලුම්පත් සඛ්‍යාවක කටයුතු නිම කර තිබුණි. ඒ අනුව 2015 වර්ෂය අවසාන වන විට කටයුතු කිරිමට ඉල්ලුම්පත් 877 ක් පැවැතුණි. එම ඉල්ලුම්පත් අතර වර්ෂ 10 කට වඩා පැරණි ඉල්ලුම්පත් 21 ක්ද, වර්ෂ 6 ත් වර්ෂ 10 ත් අතර කාලයක සිට පැවැත එන ඉල්ලුම්පත් 54 ක් හා වර්ෂ 3 කට වැඩි වර්ෂ 6 කට අඩු කාලයක සිට පැවැත එන ඉල්ලුම්පත් 91 ක්ද, පැවැතුණි.

3.5 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවකත වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | - | 01 |
| (ii) | ද්විතියික මට්ටම | 14 | 08 | 06 |
| (iii) | ප්‍රාථමික මට්ටම | 06 | 05 | 01 |
| | **එකතුව** | **21** | **13** | **08** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවේ ලේකම් තනතුරෙහි වැඩ බැලීම සඳහා අධිකරණ අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරු කටයුතු කර තිබූ බැවින් දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු සඳහා උපදෙස් සහ අනුමැතීන් ලබා ගැනීමට දෛනිකව අධිකරණ අමාත්‍යාංශයට නිලධාරීන්ට යාමට සිදුවී තිබුණි. එබැවින් දෛනික රාජකාරි නිසි වේලාවට සිදු කිරීමට එය බාධාවක් වී තිබුණි.

(ආ) ලසු ලේඛන නිලධාරීන් තිදෙනෙක් පුරප්පාඩු වී පවතින බැවින් අවශ්‍ය වේලාවට නඩු වාර්තා යතුරු ලේඛනය කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව සතුව වාහන දෙකක් පැවතියද, රියදුරු පුරප්පාඩුවක් නිසා වාහන ඌන උපයොජන තත්ත්වයේ පැවතුණි.